ආසියාවේ පළවන
එකම කතෝලික ළමා පුවත් පත

ක්‍රි. ව. 2014 ඔක්තෝබර් 20 සඳුදා
06 වෙළුම - 49 කලබ
සතිපතා පත්‍රය - පිටු 16

LP - QD / 36/ News/ 2014

# ළමා ප්‍රදීපය

මිල රු 10/-



## මේ ජපමාල මාසයයි !

## නිරන්තර ජපමාල උච්චාරණයට පුංචි අපිත් පුරුදු වෙමු !

Lama Pradeepaya

ළමා ප්‍රදීපය

ආරම්භය - 2008 ඔක්තෝබර් 06 සඳුදා

කොළඹ කතෝලික මුද්‍රණාලය, කොළඹ 08. / දුරකතන අංකය - 2695984 / 4899611
ෆැක්ස් : 2692586 - ඊ-මේල් lamapradeepaya@yahoo.com
වෙබ් අඩවිය - www.colombocatholicpress.com

# දිව්‍ය සත්ප්‍රසාදයේ මහිලාව වන කුමරි මරියාවෝ

**ආදරණීය දුවේ පුතේ...**

අප දේව මාතාවන් පිළිබඳව විශේෂාකාරයෙන් මෙනෙහි කරන මේ සුවිශේෂී වසර තුළදී අපි එතුමියගේ ජීවිතයේ විවිධ පැතිකඩයන් පිළිබඳව ගැඹුරු මෙනෙහි කිරීමක යෙදුනා. කුමරි මරියාවන්ගේ ජීවිතය හා බැඳුනු සියළුම සිද්ධීන් අති සුවිශේෂයි. කතෝලික අපට මෙනෙහි කරන්නට අපමණ දෑ එහි අඩංගුයි.

පද්මිණී නානායක්කාර අප ගුරු මෑණියන් මෙවර පුංචි ඔබට මෙනෙහි කරන්නට කුමරි මරියාවන්ගේ ජීවිතයේ අති විශේෂ පැතිකඩක් ගැන අද ළමා ප්‍රදීපයෙන් හෙළිදරව්වක් කරනවා. ''දිව්‍ය සත්ප්‍රසාද මහිලාව වන කුමරි මරියාවෝ'' යන මේ මෙනෙහි කිරීමට පුංචි ඔබව සහභාගි කර ගන්නට මෙලෙස අද මෙම ලිපිය හා බැඳුණු කරුණු ඔබ ඉදිරියේ දිග හරිනවා. බයිබලය ආශ්‍රිතව මේ කරුණු හොඳින් හදාරන්නටයි, මේ කරන ආරාධනාව!

**ඔබ සැමට ජේසු පිහිටයි !**

සංස්කාරක
ගරු ශාන්ත සාගර හෙට්ටිආරච්චි පියතුමා

ගාබ්‍රියල් දේව දූතයා දෙවියන් වහන්සේගේ පණිවිඩය මරියතුමියට දැන්වූ විට ''ඔබ වචනය ලෙස මට සිදුවේවායි'' මරියතුමිය ඊට ප්‍රතිචාරය දැක්වූ පසු මරිමව් කුස තුළ ශුද්ධාත්තම අනුහාවයෙන් දේව වචනය මාංශගතවීම සිදුවිය. මෙම ක්‍රියාවලිය හා දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ අතර ඇත්තේද එක්තරා ආකාරයක සහ සම්බන්ධතාවයකි. දිව්‍ය පූජාව අවස්ථාවේදී දිව්‍යරහස් කරන විට සිදු වන්නේද එවැනි ආකාරයේ ක්‍රියාවලියකි. එනම් දිව්‍ය පූජය තුළ ක්‍රිස්තුන් වහන්සේ මාංශගතවීමය. මෙය අප පියවි ඇසට නොපෙනෙන සත්‍ය වැඩසිටීමකි. අල්තාරය මත පිදෙනා දිව්‍ය පූජා යාගය වනාහී කල්වාරිය මත පිදු ගැලවීමේ යාගය සක්‍රමේන්තු ආකාරයෙන් නැවත නැවත අනුස්මරණය කිරීමකි. මෙලෙස ශුද්ධවූ අල්තාරය මත ප්‍රස්තුත වන්නේ ශුද්ධාත්ම බලයෙන් මරියතුමිය තුළ ජනනය වුන ක්‍රිස්තුන් වහන්සේගේ ශරීරය හා රුධිරයයි. එනම් එය සමවන්නේ කල්වාරි දිව්‍ය යාගය තුළ පිදෙනා ගැලවීමේ රුධිරයටය. මරියතුමිය දිව්‍ය සත්ප්‍රසාද මහිලාව ලෙස හඳුන්වන්නේ එම කරුණු සැලකිල්ලට ගෙනය.

කල්වාරි කඳු මුදුනේ ක්‍රිස්තුන් වහන්සේ මරිමවුන් අප මව ලෙස භාර දෙනු ලබයි. ජුවාම් තුමාට කතා කරමින්, ''මෙන්න ඔබේ මෑණියෝ'' යනුවෙන් මරිමව සකල මානව සංහතියේ මෑණියන් ලෙස භාර දෙනු ලබයි. (ජුවාම් 19/27) කල්වාරි කුරුසිය පාමුල මරියතුමිය වැඩ සිටියාක් මෙන් දිව්‍ය පූජා යාගයේ සෑම සත්ප්‍රසාද මෙහෙයකදීම එතුමිය වැඩ සිටින්නීය. ක්‍රිස්තුන් වහන්සේ විසින් මිනිස් සංහතිය වෙත දයාද කළ ශ්‍රේෂ්ඨතම තිළිණය වන දිව්‍ය සත්ප්‍රසාදීය යාගය තුළ මරිය තුමියගේ මැදහත්වීම අති ප්‍රබලය.

ක්‍රිස්තු අභිරහස ගැන අධ්‍යයනය කිරීමට ඇති විශිෂ්ටතම පාසල මරිය තුමියගේ හදවත නමැති පාසලයි. දිව්‍ය යාගය අවබෝධ කර ගන්නට හා ජීවත්වන්නට කියා දීමට එතුමිය හැර වෙන කිසිවෙකු නොමැත. මරිය තුමියගේ සිප් අරණේ ගුරුතුමිය මරිය තුමිය වන අතර, ප්‍රථම ශිෂ්‍යයා වන්නේ ශුද්ධවූ ජුවාම් අපෝස්තුලු තුමාය. ජුවාම් තුමාගේ ආදර්ශය අනුව යමින් විශ්වාසිකයන් විසින් තමා වෙත භාරදුන් තැනැත්තිය සමඟ ගමන් කළ යුතුවෙමු.

දිව්‍ය සත්ප්‍රසාදය විශ්වාසයේ අභිරහසකි. පැරණි ගිවිසුමේ විශ්වාසයේ පියා ලෙස ආබ්‍රහම් සිටියාක් මෙන්, නව ගිවිසුම ආරම්භයේදී විශ්වාසයේ බලගතු තැනැත්තා ලෙස දේව මාතාවන් සිටින්නීය . මරිය තුමියගේ හදවත නමැති සිප් හලෙන් දිව්‍ය සත්ප්‍රසාදීය සමිඳුන් සමඟ ඉතා ගැඹුරු හා නිරන්තර සම්බන්ධතාවයක් ඇති කර ගැනීමට අපෝස්තුලුවරු ඉගෙන ගන්නට ඇත. මරියතුමිය ජේසුස් වහන්සේගෙන් වෙන් කිරීමට නොහැකිය. කන්‍යාමරිය තුමිය අපගේ මව, දිව්‍ය සත්ප්‍රසාදයේ ගුරුවරිය හා කාන්තාව වශයෙන් අපට දීම ගැනද අපි දෙවියන් වහන්සේට ස්තුති කරමු.

**පද්මිණී නානායක්කාර**

# නැන්දා කෙනෙකුගෙන් මේ ඔවදන පුංචි ඔබටයි.

වෙලාව හවස 5 ට විතර ඇති. කලබලකාරි වු මහ පාරට මමත් ආවේ හදිසි අවශ්‍යතාවයකට දන්න නොදන්න දෙනෝදහක් එහාට මෙහාට යනවා. පාසල් නිල ඇඳුමින්ම මගේ ඉස්සරහට දෙන්නෙක් එනවා. හොඳට දන්න කියන දරුවෝ තමුන්ගේ දහම් පාසල් ගුරුතුමීව ඉස්සරහට හම්බඋනාම අඩුමගානේ හිනාවෙන්නවත් පුළුවන්නේද..? මට මතක් උනා හවස් පංතියෙ ඒ ගොල්ලන්ව වටකරගෙන විභාගෙට ආගම උගන්වන ගමන් ඊට වඩා වැඩියෙන් ජීවිතයට අවශ්‍ය දේවල් උගන්වපු හැටි. එක්කෙනෙක් නම් කට පුරවල හිනාඋනා. හැබැයි ඒ දවස්වල කිරිල්ලි වගෙ කියවපු කෙනාට  කතා කරන්න වචන අමතක උනා. වගේ, අනික් කෙනාට නම් උතුර දකුණු මාරු උනා වගේ. මට හිනා ගියෙ මාව මග අරින්න කරකැවුණු කරකැවිල්ලට...

ආදරණීය දුවේ, පුතේ, ''ආදරය'' කියන්නේ නරක දෙයක් නෙමේ. හැබැයි ඒක නියම කාලයේදී හරිම බුද්ධිමත්ව ගන්න ඕනා තීරණයක්. පාසල් වියේදී ඇතිවන ඒ විශේෂ හැඟීම් වලට අනික් සේරම දේවල් වලට වඩා මුල් තැන දුන්නොත් වෙන්නෙ යහපතක් නම් නෙමේ. අධ්‍යාපනයට මුල්තැන දිලා තමන්ගේ ජීවිතයට වටිනාකමක් එක් කර ගන්න. එතකොට තමා කාටකාටත් දැනෙන්නේ තමුන් මොනතරම් වටිනා පුද්ගලයෙක්ද කියලා. දෙවියන් වහන්සේ දුන්න නිදහස් කැමැත්ත දුර දිග නොබල පාවිච්චි කරන්න හොඳ නෑ නේද?.

**නිලූෂා ඇන් හිමාලි**

## සුදුතුම් පියේ



ඔබ දකිනතුරා ඉවසුම් නැතේ  
කිතු හද බැදි අප සැමටා  
ජේසු වතේ සිරි දකිමු ඔබ වතේ  
මහගු දෙයකි අපටා...  
ඔබේ අත අල්ලා ඒ උණුසුමිනේ  
පිහිටක් අප ලැබ ගන්ටා.....  
ෆ්‍රැන්සිස් පියේ මෙහි වඩිනු මැනේ  
අප සිත් තුටු වෙයි එවිටා.......

**ඩිලීෂියා තිලකරත්න (ආචාර්ය මඩුල්ල)**

ශා මරියා දහම් පාසල - කෑගල්ල

# අක්කා කෙනෙකුගෙන් පුංචි ඔබට ඔවදනක!

පසුගිය ලිපිය හා සබැඳේ

## අද මිනිසුන්ගේ සිතුම් පැතුම්

යාච්ඤාව අප අතරින් දුරස්වීම වලක්වා ගැනීමට විශේෂයෙන් කාර්ය බහුල පුද්ගලයන් තමන් යන එන ගමන් වලදී තම සිතෙන් මෙනෙහි කිරීම යෝග්‍ය වනු ඇත. එසේම තමාට විවේක තිබෙන සෑම මොහොතකම පවුලේ සාමාජිකයින් සමඟ සුහදශීලීව කතා කර එකිනෙකාට ඇති ප්‍රශ්න සාකච්ඡා කර ඒවාට විසඳුම් ලබා ගැනීම තුළින් අනාගතයේ පවුල් තුල ඇති විය හැකි විවිධ ආරවුල් වලක්වා ගැනීමට අවකාශ ලැබේ. එසේම අසල්වැසියන් සමඟ සුහදශීලී හා සහෝදරත්වයෙන් කටයුතු කිරීමෙන් ඕනෑම අවස්ථාවක උදව් ලබා ගැනීමට හැකියාව ලැබෙනු ඇත. සෑම විටම අවංකව කටයුතු කිරීම තුළින් සැමටම ආදර්ශයක් වීම.

එසේම වර්තමානයේ පාසල් ළමුන් හා තරුණ පරපුර අතර ආගම හා යාච්ඤාව යන තේමා ක්‍රමයෙන් ගිලිහෙන බව පෙනී යයි. අධ්‍යාපනය හා රැකියාව යනාදිය සඳහා ඇති තරඟකාරීත්වය වර්ධනය වීම මෙයට ප්‍රධාන හේතුවක් වී ඇත. එහෙත් ආදර නංගියේ, මල්ලීයේ, අප නිවැරදිව සමබරතාවයෙන් ආගම හා ජීවිතය පවත්වා ගෙන යා යුතුයි. දැනුමෙන් පමණක් සන්නද්ධ පුද්ගලයෙකු වනවාට වඩා දැනුමෙන් යහ ජීවනයෙන් ආගමානුකූලව ජීවත් වන යහපත් පුද්ගලයෙකු රටට වඩාත් වැඩදායී වනු ඇත. එසේ නම් අප තවම ප්‍රමාද නැත. අපට තවමත් කාලය ඉතිරි වී ඇත. අපගේ අතින් සිදු වී ඇති මග හැරීම නිවැරද කර ගනිමින් ආගම කෙරෙහි අප දක්වන සැලකිල්ලේ ප්‍රමාණය වර්ධනය කර ගැනීමට කාලය එළඹී ඇත. අප එකිනෙකා තම තමන්ව තේරුම් ගෙන සැබෑ මනස්ථාපනයක් හා වෙනසක් ඇති කර ගෙන ජීවත් වීමට අදිටන් කරගනිමු. අපට යහපත උගන්වන්නට වෙර දරන ගුරුවරුන්ට , දෙමව්පියන්ට වැඩිහිටියන්ට ගරු කරමින් ඒවා පිළි පැදීමට මැලි නොවෙමු. එවිට සමාජශීලි යහපත් අනාගත පරපුරක් බිහි කිරීමට වර්තමාන පරපුරට හැකියාව උදා වනු නොඅනුමානය.

වැඩිහිටි පරපුරද බාල පරපුරට ආදර්ශයක් හා අනුගමනය කළ හැකි පරිදි යහපත් චරිතයක් ඇති කර ගනිමින් ජීවත් විය යුතුය. සෑම අතින්ම සර්ව සම්පූර්ණ මිනිසුන් ලෝකයේ බොහෝ සෙයින් නොමැත. සෑම පුද්ගලයෙකුටම කුමන හෝ අඩුපාඩුවක් ගැටළුවක් ඇති බව සැවොම පිළිගන්නා කරුණකි. ඒ කෙසේ වුවත් වැරදි මග හරිමන් ඒවා නිවැරදි කර ගැනීම තුළින් යහපත් දිවියක් ගෙවීමට මිනිසුන් උත්සුක විය යුතුය. අප එකිතෙකාගේ සිත් පිරිසිදු කර ගෙන යහපත් චේතනාවන්ගෙන් පුරවා ගැනීම තුළින් සමාජයද ආලෝකමත්වී බැබලෙනු නියතය.

**ශානිකා ඇන් මධුභාෂිනී**

ශු. ජපමාල මාතා සිද්ධස්ථානය - කුඩාමඩුවැල්ල (තොඩුවාව මීසම)



නාත්තන්ඩිය නිර්මල ලූර්දු දේවමාතා සිද්ධස්ථානයේ ළමෝ 68 ක් පසුගියදා ප්‍රථම වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. මීසම් සේවක ගරු උපාලි වර්විල් සහයක ගරු ජුඩ් චානක පියතුමන්ලා, ගරු දර්ශනී පැවදි සොයුරිය, ආචාර්ය මඩුල්ල හා ළමුන් ළමා ප්‍රදීපය සඳහා සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශ්‍රියාංගණී ෆිලිෂියා**






කළුතර සිරිකුරුස දේවස්ථානයේ දරු දැරියෝ 25 ක් පසුගියදා පළමු වරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබුහ. දිව්‍ය යාගයෙන් අනතුරුව ළමුන්, මීසම් සේවක ගරු සුරාන් අත්තිඩිය පියතුමා, දහම් පාසල් විදුහල්පතිනි ගරු ශිරානි පැවිදි සොයුරිය, දහම් ගුරුවරියන් සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **සුරලි කුරේ**



පුත්තලම ශා. මරියා දහම් පාසලේ ළමුන් 33ක් පසුගියද පළමුවරට දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ලැබීය. මීසම් සේවක ගරු වින්සන් ජේයරාසා, මීසම් සහයක ගරු ප්‍රභාත් සංජය , විරාජ් එරංග යන පියතුමන්ලාගේ අනුශසකත්වයෙන්, ගරු රොසලින් පැවිදි සොයුරිය ඇතුළු ආචාර්ය මඩුල්ලේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරිනි. දිව බොදුන් ලැබු ළමුන් ගරු සහයක පියතුමන්ලා, ගරු පැවිදි සොයුරිය හා ගුරුභවතුන් සමඟ සමූහ සේයාරුවකට පෙනී සිටි අයුරු. **ශානුක මධුරංග**

# ළමා ඔබත් යහපත් පුරවැසියෙක්ද?

ෆ්‍රීඩා විල්ලවරායන් විසිනි

**● කුඩා කළ සිටම සැමටම ආදරය දක්වන්නට අප පුරුදු විය යුතුයි.**

ආදරය කිරීම මහගු ගුණයක් අප කුඩා කළ සිටම අපගේ දෙමව්පියන්ට සහෝදර සහෝදරියන්ට , ගුරුවරුන්ට, අසල් වැසියන්ට සහ අපගේ මිතුරු මිතුරියන්ට ආදරය කිරීමට පුරුදු වන්නට ඕනෑ. සමහර විට ආදරදක්වන අවස්ථා වලදී අපට පරිත්‍යාගශීලීවන්නටත් සිදුවෙන අවස්ථා බොහොමයි. කෙනෙකුගෙන් තවත් කෙනෙකුට ලැබෙන ආදරය තරම් බලගතු දෙයක් තවත් ලොවේ නැති තරම් බව අපි හොඳින් හිතේ තබා ගනිමු.

**● පිරිසිදු සිත් ඇත්තන් වන්නට උත්සාහ කළ යුතුයි.**

පිරිසිදු සිත් ඇත්තන් භාග්‍යවන්තයින් බව ඔබ සැම සමහර විට අසා ඇති. පිරිසිදු සිතකින් අප ජීවත් වන සමාජය හා බැඳී ඉන්නා විට එයින් ලැබෙන ප්‍රතික්‍රියා ඉතාම ඵලදායක බවත් ඔබ සැම දෙනාම ඔබගේ ගුරු දෙගුරුන්ගෙන් ඉගෙන ගෙන ඇත. පිරිසිදු සිතකට ඊර්ෂ්‍යාවේ, ක්‍රෝධයේ සහ වෛරයේ කැළැල් එකතුවන්නේ නැහැ. අපත් කුඩා කළ සිටම යහපත් සිත් ඇත්තන් වීමට මහන්සි ගත යුතුයි.

**● ඉගෙනීමට මුල් තැන දෙන්න පුරුදු විය යුතුයි.**

ඉගෙනීම, කුඩා ඔබට ඇති ඉතාමත්ම වැදගත් කාර්යය සහ වගකීමයි. සැම විටම අප ඉගෙනීමේ කටයුතු වලට මුල් තැන දෙන්න මතක තබා ගත යුතුයි. ඒ අතරම බාහිර අධ්‍යාපන කටයුතු ගැනද අප විමසිලිමත් විය යුතුයි. එදිනෙදා පාසල් කටයුතු අවසාන වූ පසු රූපවාහිනියේම ගැලී නොසිට කියවීම, චිත්‍ර ඇඳීම , සංගීතය පුහුණුවීම වැනි මනස සපුරන කටයුතුවල ද පිහිනීම, බැඩ්මින්ටන්, ටෙනිස් සහ ක්‍රිකට් ක්‍රීඩාවන් වැනි ශරීරයට ව්‍යායාම ගෙන දෙන කටයුතු වල ද නියැලීමෙන්. මානසික සහ ශාරීරික පෝෂණය වැඩි දියුණු කර ගන්නට අපට හැකි වනු නොඅනුමානයි.

**● කල්පනාකාරීව සහ පිලිවෙලට වැඩ කරන්නට උත්සාහ ගත යුතුයි.**

කල්පනාකාරීව සහ පිළිවෙලට වැඩ කිරීමට අප කුඩා කාලයේ සිටම උත්සාහ දරන්න ඕනෑ. අපගේ පොත් පත්, පෑන් හා පැන්සල් ආදිය අප විසින් නිසි තැන්වල තබන්නත් අප හැම විටම පුරුදු පුහුණු විය යුතුයි. නින්දෙන් අවදි වූ පසුත් අපගේ පළමු කාර්යය විය යුත්තේ අප නිදාගත් ඇඳ නිසි පරිදි සැකසීමයි. එය අප අවදි වූ සැනින්ම කළ යුතු කාර්යයක් බව නම් මතක තබා ගන්නම ඕනෑ. නිසි ලෙස සැකසූ කාමරයක ඇති චමත්කාරය වචනයකින් විස්තර කළ නොහැකි තරම්ය.

ඉදිරියට ....

## පළඟතුරය ශා. ආනා දහම් ළමුන්ට ලේඛක වැඩමුළුවක්



පළඟතුරය සා. ආනා දහම් පාසලේ 6 ශ්‍රේණියේ සිට ඉහළ ළමුන් සඳහා ළමා ලේඛක වැඩමුළුවක් පසුගියදා දහම් පාසල් ශාලාවේදී පැවැත්වුණි.

මෙය මෙහෙයවනු ලැබුවේ ළමා ප්‍රදීපය සහය සංස්කාරක කුමර නයනජිත් මහතාය. ළමුන්ගේ නිර්මාණ හැකියාවන් වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව මීසම් සේවක ගුරු කිංස්ලි අයිවන් පියතුමාගේ මඟ පෙන්වීම යටතේ ආචාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් මෙය සංවිධානය කරයි.

සේයා හා සටහන - ඇන්ටන් ජෙරාඩ්

## මොරටුව, කටුකුරුන්ද මීසමේ දහම් ළමෝ ලෝක ළමා දිනය සමරති.



මොරටුව කටුකුරුන්ද ශා. මරියා හා මොරටුව, මෝදර හා. ජුසේවාස් දහම් ළමෝ ලෝක ළමා දිනය සමරමින් දේවස්ථාන භූමියේදී ක්‍රීඩා උත්සවයකට සහභාගී වූහ. මීසම් සේවක ගුරු රසික ලෝරන්ස් පියතුමාගේ අදහසකට අනුව දහම් පාසල් ආචාර්ය මණ්ඩලයේ සහයෝගයෙන් මෙදින කටයුතු සංවිධානය කෙරෙනි. මෙහිදී ළමුන් වෙනුවෙන් තරඟ රැසක් පැවැත්වුණි. මෙදින අවස්ථාවක් සේයාරුවෙහි දිස්වේ.

සටහන - අසික ප්‍රියදර්ශන

# 2014 අ.පො.ස. සා. පෙළ කතෝලික ධර්මය පුනරීක්ෂණ පාඩම් මාලාව

## සිව්වන තේමාව :- ක්‍රිස්තියානි යාච්ඤාව

**ක්‍රිස්තියානි යාච්ඤාව**

**4. ක්‍රිස්තියානි යාච්ඤාව**

**4.1 යාච්ඤාව යනු කුමක්ද**

**4.2. පුරාණ ගිවිසුම තුළ යාච්ඤාව**

**4.3 නව ගිවිසුම තුළ යාච්ඤාව**

- **4.3.1 ජේසුස් වහන්සේගේ යාච්ඤා**
- **4.3.2 ස්වාමිවාක් ආරාධනාව**
- **4.3.3 උත්තම පූජක යාච්ඤා**
- **4.3.4 ස්වාමිවාක් ආරාධනාව හා උත්තම පූජක යාච්ඤා පිළිබඳ සැසඳීමක්**
- **4.3.5 යාච්ඤාව සහ නව ගිවිසුවේ වෙනත් චරිත**

**4.4 යාච්ඤාව සහ මුල් කිතුනු සභාව**

**4.5 යාච්ඤාව සහ ශුද්ධවන්ත ජීවිතය**

**4.6 යාච්ඤාව වර්තමාන සමාජයට**

### පසුගිය ප්‍රශ්න එකතුව (2008 -2012)

**4.1 යාච්ඤාව යනු කුමක්ද**

1. යාච්ඤාවේ විවිධ ස්වරූප දෙකක් නම් කරන්න. (2011/06.1)

2. ශුද්ධවූ සභාවේ යාච්ඤා වර්ග (ප්‍රභේද) දෙකක් නම් කරන්න. (2012/01.7)

3. ඔබ පවුලේ සැම දෙනා එක්රැස් වී දිනපතා යාච්ඤා කිරීම කුමන යාච්ඤා වර්ගයට අයත් වේද? (2010/36)

4. ශුද්ධවූ සභාවේ නිල යැදුම ලෙස හැඳින්වෙන්නේ .... (2012/22)

5. යාච්ඤාවේ කැපී පෙනෙන විශේෂ ලක්ෂණ තුනක් ලියන්න. (2011/06.2)

6. කිතුනුවන් යාච්ඤා කිරීමේ ප්‍රධාන අරමුණ වනුයේ. (2010/38)

7. යාච්ඤාව ජීවිතයට ඒකාබද්ධ කර ගැනීමෙන් (2009/24)

8. කෙටි සටහන් ලියන්න ''පෞද්ගලික යාච්ඤා (2012/07.5)

**4.2. පුරාණ ගිවිසුම තුළ යාච්ඤාව**

9. පුරාණ ගිවිසුවේ යාච්ඤාව පිළිබඳ විශිෂ්ටතම කෘතිය කුමක්ද? (මුලාකෘති ප්‍රශ්න පත්‍රය 2008/01.5)

**4.3 නව ගිවිසුම තුළ යාච්ඤාව**

**4.3.1 ජේසුස් වහන්සේගේ යාච්ඤා**

10. තම ජීවිතය එකම යාච්ඤාවක් බව යම් කෙනෙකුට කිව හැකිව තිබුණා නම් එසේ කීමට හැකි වනුයේ, (2011/40)

11. දෙවි පියාණන්ට කෙලෙස යාච්ඤා කළ යුතුදැයි පෙන්වාදීමට ජේසුස් වහන්සේ ඉගැන්වූ උපමා දෙකක් නම් කරන්න. (2008/01.8)

12. නොකඩවා යාච්ඤා කිරීමේ අගය පෙන්වා දෙන උපමාව වන්නේ...., (2010/34)

13. අධෛර්යය නොවී නොකඩවා යාච්ඤාවෙහි යෙදිය යුතු බව දක්වන පිණිස ජේසුස් වහන්සේ වදාළ උපමාව නම්.(2011/34)

14. යාච්ඤාව සම්බන්ධව ක්‍රිස්තුන් වහන්සේ විසින් වදාළ උපමා දෙකක් නම් කරන්න. (2012.01.05)

15. ජේසුස් වහන්සේ පෞද්ගලිකව යාච්ඤා කළ අවස්ථා දෙකක් ලියන්න. (2010/03.1)

16. ගෙත්සමනි උයනේදී ජේසුස් වහන්සේ සිය ශ්‍රාවකයන්ට අවවාද කළේ. (2010/32)

17. ජේසුස් වහන්සේ ඔලිව් කන්දේදී ශ්‍රාවකයන්ගේ ඉල්ලා සිටියේ කුමක්ද? (2012/33)

18. ජේසුස් වහන්සේ නිතර නිතර දෙවි පියාට යාච්ඤා කළේ... (2010/33)

19. ''ඔබ යාච්ඤා කරන කළ ඔබේම ඇතුළු කාමරයට වැද දොර වසාගෙන............. ඔබේ පියාණන්ට යාච්ඤා කරන්න. හිස්තැනට යෝග්‍ය වචනය වනුයේ, (2011/35)

20. අපගේ ජීවිත ආලෝකවත් වීම සඳහා අත්‍යවශ්‍ය අංගයකි. (2011/18)

ගරු ඩේමියන් පෙරේරා පියතුමා

# නාත්තන්ඩිය මීසමේ යොවුන් දූ පුතුන්ගේ කුසලතා එළිදැක්මක්





නාත්තන්ඩිය මීසමේ අභිවෘර්ධි ආලේපය ලැබූ ළමුන්ගේ කුසලතා එළිදැක්මේ උළෙලක් පසුගියදා පැවැත්වුණි. මීසම් සහයක ගරු ජුඩ් චානක පියතුමන්ගේ මගපෙන්වීමෙන් මීසම් සේවක ගරු උපාලි චර්චිල් පියතුමන්ගේ අනුශාසකත්වයෙන් පැවැති මෙයට ළමුන්ගේ රැගුම් ගැයුම්, වැයුම් ඇතුළත් වුණි. මීසමට අයත් සියලු දෙවස්ථානවල ළමුන් එකිනෙකා හඳුනාගැනීමත් , සහෝදරත්වය හා සුහදශීලී බව වැඩි වර්ධනය වීම මෙහි විශේෂත්වයි. මෙදින අවස්ථාවන් ළමා ප්‍රදීපය කැමරා කාචයේ සටහන් වී තිබූ අයුරු.

**ශ්‍රියාංගණී ෆිලිපියා**

## දුවා දරුවන්ට පෙම් බැඳි දේව අම්මා.



ආදර දුවේ පුතේ, අපගේ ස්වර්ගීය මෑණියන් වන මරියෝත්තමාවන් ස්වර්ග යෙන් මෙලොවට පැමිණ ලූර්දු , පාතිමා, ගුවාඩලුපේ, වේලන්කන්නි ආදි ලොවපුරා ස්ථාන රාශියකදී දර්ශනය වීම ගැන ඔයාලා අසා ඇති ඒ හැම තැනකදීම එතුමිය දර්ශනය වුනේ ජපමාලය අතේ ඇතිවයි. ඒ වාගේම හැම තැනකදීම එතුමිය දර්ශනය කළ අයගෙන් ඉල්ලා සිටියේ ජපමාලය උච්චාරණය කරන්න කියලයි.

ඔයාලා දන්නවාද මරිය තුමිය වැඩියෙන්ම දර්ශනය වෙලා තියෙන්නේ ඔයාලා වගේ පුංචි දුලා පුතාලටයි. ඒ විතරක් නෙමේ පාතිමාවෙදි පුංචි ලූසි හා ජසින්තා යන දුවලාත් ප්‍රැන්සිස්කෝ නමැති පුතාත් සමග එතුමිය ජපමාලය උච්චාරණය කරලත් තියෙනවා. අපි ජපමාල පන්තියක් පාසා කියන ''අහෝ මාගේ ජේසුනි '' යාච්ඤාව ඒ දරු තිදෙනාට කියා දීලා තියෙන්නේත් මරිය තුමියයි. ස්වර්ගයට යන්න නම් ගොඩක් ජපමාලය කියන්න කියලා පාතිමා වේ දරු තුන්දෙනාට එතුමිය අවවාද කරලා තියෙනවා. ඉතින් දුවේ පුතේ ඔයාලාගෙ ආදර අම්මා මරියතුමිය ඉතාමත් ආශා කරන ජපමාලය දිනපතා උච්චාරණය කරන්න මේ ජපමාලයේ මාසෙදි පටන් ගන්න. එතකොට මරියතුමිය ඔයාලාට හුගාක් ආදරය වෙයි. හුගාක් පිහිට වෙයි. ඒ වගේම ඔයාලා කොහේ හරි යනකොට වුනත් ජපමාලය සාක්කුවේ දාගෙන යන්න. ඔයාලාට එතකොට මරිය තුමියගේ ආරක්ෂාව ලැබෙයි.

**ලිඩ්වින් කිරිඇල්දෙණිය මාමා**

## මරි මවේ

උතුරා යන සෙනෙහසකින් මා ඔබ
තුරුලට අරගෙන කොතෙකුත් වැහෙන ආදරයෙන්
නිති ඔබ මා සුරතින් රැකගෙන
එදා ජේසු බිළිඳු මට පෙන්වුව අරමුණ වෙත පියමනින්න
දුන මැන ආශීර්වාදය නිති ලොව ජය ලබන්න
දෝරේ ගලන ආදරයෙන් ඔබ මා හට නිති වරම් රැගෙන
දුලි මැදින් මට පැමිණෙන
ජීවිතාභියෝග වලට නොබියව මුහුණ දෙන්න
කොතෙකුත් නොවැටහේ ඇයි දැයි
ඔබ මට මෙපමණ ආදරයක් දක්වන්නේ
කියා දෙන්න මරි මවේ මා ඔබ තුරුලට අරගෙන

**මධුෂා ගිම්හානි සිල්වා**
**11 ශ්‍රේණිය**
**සිරි කුරුස විදුහල - ගම්පහ**

# අති උතුම් ප්‍රැන්සිස් සසුනිසුරාණෝ ලක්දිව දි



අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් සිරිලකට වැඩම කිරීම 2015 ජනවාරි 13 වැනිදා සිදුවන බව ඔබ කොයි කවුරුත් දැන් දන්නවා නේද? ශුද්ධෝත්තම පියතුමකු මේ පින්බිමට වැඩම කරන තෙවැනි අවස්ථාව වන මෙවර ඒ ප්‍රීතිය දෙගුණ තෙගුණ වන්නේ සිරිලක අපෝස්තුළු වරයාණන්වූ භාග්‍යවන්ත ජුසේවාස් පියා ජනවාරි 14 වැනිදා අගනුවර ගාලුමුවදොර පිටියේදී සාන්තුවරයට ඔසවනු ලැබීමේ සිද්ධියත් නිසාය.

2015 අති උතුම් ප්‍රැන්සිස් සුදුතුම් පියාණන් සිරිලකට සැපත් වීමේ දින 100 වැඩසටහනක් ඔක්තෝබර් 05 වැනිදා තේවත්ත ජාතික බැසිලිකාවෙන් ආරම්භ විය. එදින දිව්‍ය පූජා මෙහෙයක් සමඟ විශේෂ වැඩසටහනක් පැවැති අතර ඉදිරියේදී සසුන්පිය ලංකා ගමන නිමිත්තෙන් වැඩසටහන් රැසක් දියත් වීමට නියමිතය.

## සුදුතුම් පිය ශ්‍රී ලංකා ගමනේ නිල තේමාව "ප්‍රේමයේ පවතින්න"

"ප්‍රේමයේ පවතින්න" යන තේමාව පදනම් වී ඇත්තේ ශුද්ධවූ බයිබලයේ ජොහාන් සුවිශේෂයේ 15:9 වගන්තියෙනි: "පියාණන් වහන්සේ මට ප්‍රේම කළාක් මෙන් ම මම ද ඔබට ප්‍රේම කළෙමි. මාගේ ප්‍රේමයේ පවතින්න." සැබෑ ප්‍රේමය යනු කුමක්ද? බොහෝ දෙනකු අසන මේ පැනයට ශුද්ධවූ බයිබලයේ ශුද්ධවූ ජුවාමිතුමන් ලියූ පළමු හසුන ඉතා කෙටි ගැඹුරු පිළිතුරක් සපයයි. "දෙවියන් වහන්සේ ප්‍රේමය ය." (4:8) ප්‍රේමයේ මූලාශ්‍රය ද, ප්‍රේමයේ පූර්ණ ප්‍රමිතිය ද, ප්‍රේම කිරීමට අප දිරිමත් කරන සහ ප්‍රේම කිරීමට අපට අණ කරන තැනැන්වහන්සේ ද උන්වහන්සේය.

දෙවියන් වහන්සේගේ ප්‍රේමය පූර්ණ ලෙස ප්‍රකාශවූයේ ලෝකයේ ගැලවුම්කරුවාණන් ලෙස ජේසුස් වහන්සේ මෙලොවට එවීම මගිනි. ජේසුස් වහන්සේ දේව පුත්‍රයාණන් වන නිසා, උන්වහන්සේ සහ පියාණන් වහන්සේ අතර අසමසම සබඳතාවයක් තිබේ; එහෙයින් උන්වහන්සේ ගැලවීමේ මැදිහත් කරුවාණන් ද, අප අතර වැඩ වාසය කිරීමේ අභිරහස ද, ප්‍රේමයේ පූර්ණත්වය ද වන සේක.



ප්‍රේමයෙහි ජීවත්වන්නෝ දෙවියන් වහන්සේ තුළ ජීවත් වන්නෝය. දෙවියන් වහන්සේ සමඟ සබැඳි ජීවත් වීම සහ අන්‍යයන්ට ප්‍රේම කිරීම එකිනෙකින් වෙන් කළ නොහැකිය. පූර්ණ ප්‍රේමයේ හැඩය ත්‍රිකෝණාකාර වෙයි. එහි කෝණ තුන වන්නේ දෙවියන් වහන්සේ, මම සහ මගේ අසල්වැසියා ය. ත්‍රිකෝණයේ එක් කෝණයක් හෝ අඩුවූ විට ප්‍රේමය අසම්පූර්ණ සහ අපරිණත බවට පත් වෙයි. කෝණ තුන සම්පූර්ණ වූ කල්හි ප්‍රේමය ද සම්පූර්ණ වෙයි.

ක්‍රිස්තුන් වහන්සේ ජීවත් කර පෙන්වූ දේව ප්‍රේමයේ පූර්ණත්වය උන් වහන්සේගෙන් අනතුරුව මිනිස් සංහතිය වෙත ගෙන යන්නට ශ්‍රාවකයින් දොලොස් දෙනකු තෝරා ගනිමින් ඔවුනට නව ආඥාවක් දුන් සේක. "මා ඔබට ප්‍රේම කළාක් මෙන් ඔබත් එකිනෙකාට ප්‍රේම කරන්න." මෙම ශ්‍රාවකයින් සහ අනෙකුත් කිතු අනුගාමිකයෝ තම ජීවිත පරිත්‍යාගයෙන් මෙම ආඥාව සැබෑවක් බවට පත් කළහ.එම ප්‍රේමයේ ආඥාව මිහිතලය පුරා පතුරු වන්නට වෙසෙසින් ඇප කැප වූ කිතු සසුනේ වත්මන් නායක එඬේරාණන් වන්නේ අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ය.

# භා. ජුසේ වාස් පියා සාන්තුවරයට ඔසවති



කිතුනු උරුමය

එදා ක්‍රිස්තුන් වහන්සේ සිය ශ්‍රාවකයින්ට දෙසූ පරිදි වර්තමානයේ උන්වහන්සේ නියෝජනය කරන සුදුතුම් පියාණන් ද අප සැම හට පවසන්නේ **"ප්‍රේමයේ පවතින්න කියායි"**

## සුදුතුම් පිය ශ්‍රී ලංකා ගමනේ නිල වෙබ් අඩවිය දියත් කෙරේ

2015 ජනවාරි 13-15 ට නියමිත අති උත්තම ප්‍රැන්සිස් ශුද්ධෝත්තම පියතුමන්ගේ ශ්‍රී ලංකා ගමන වෙනුවෙන්, නිල වෙබ් අඩවියක් අරඹා ඇති අතර

**වෙබ් අඩවියේ ලිපිනය වන්නේ www.popefrancissrilanka.com යන්නයි.**

ශිරාන් මෛත්‍රී

## 2015 සුදුතුම් පිය ලංකා ගමනේ නිල කාල සටහන

**2015 ජනවාරි 13 වැනිදා**

පෙ.ව. 9.00 - කටුනායක ගුවන් තොටුපළට සැපත් වීම.
- නිල පිළිගැනීමේ රාජ්‍ය උත්සවය, විවෘත රථයක නැගී සසුන් පියා මීගමු පාර ඔස්සේ කොළඹට සපැමිණීම.
- කොළඹ අගරදගුරු මැඳුරට සම්ප්‍රාප්තිය
- සියලු රදගුරු හිමිපාණන් සමඟ කෙටි රැස්වීමකින් පසු දිවා භෝජන සංග්‍රහය.

ප.ව. 4.45 - ජනාධිපති බැහැදැකීමේ නිල චාරිකාව.
- මුද්දරයක් නිකුත් කිරීම.
- බණ්ඩාරනායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී සර්වාගමික ආගමික නායකයන් සමග රැස්වීම
- රාත්‍රි ආහාරය හා සැතපීම

**2015 ජනවාරි 14 වැනිදා**

පෙ.ව. 7.15 - මැඳුරෙන් පිටත් වීම.

පෙ.ව. 7.30 - ගාලු මුවදොර පිටිය වටා විවෘත රථයක නැගී ජනතාව අතරින් ගමන් කිරීම. දිව්‍ය පූජා යාගය - භාග්‍යවන්ත ජුසේ වාස් පියතුමා සාන්තුවරයට එසවීමේ දිව්‍ය පූජා යාගය

ප.ව. 2.00 - මඩු සිද්ධස්ථානයට සැපත් වීම

ප.ව. 3.30 - ජපමාල උච්චාරණය හා මෙහෙය

ප.ව. 4.30 - හෙළිකොප්ටර් යානයෙන් ආපසු කොළඹ බලා පිටත්වී විවේකය - රාත්‍රි ආහාරය හා සැතපීම

**ජනවාරි 15 වැනිදා**

පෙ.ව. 8.00 - ගුවන් තොටුපළ බලා පිටත් වීම.

පෙ.ව 9.00 - පිලිපීනය බලා ගුවන්ගත වීම.

# Unknown Catholic Saints

## St. John of Damascus

### *Feast Day - (December 4)*



Iohannes Damascenus, or Yuhanna Al Demashqi, also known as the "golden speaker" (literally "streaming with a gold") for his ability to write and argue, was a Syrian monk who made a crucial difference to the Church and without whom Eastern Orthodoxy might not have retained its attachment and beauty.

Born in 675 or 676 in the Syrian capital into a prominent family, the Mansour, his grandather Mansur Bin Sargun had surrended the city to the Muslims, but Damascus continued to be effectively run by a Christian civil service for hundreds of years, and John's father Sergius served the caliphs, as did John after him. One of the great polymaths of the age, John had particular skill in law, theology and music, writing hymns that are still used in Orthodox liturgy. Revered across Christendom, the Orthodox Church refers to him as "the last of the Fathers" while the Catholic Church regards him as a Doctor of the Church, in particular, the Doctor of the Assumption because of his writings on that subject.

Syria had been the land where followers of Jesus first called themselves Christian and it was steeped in the Hellenistic culture in which the faith developed.

His learned father had insisted that John "learn not only the books of the Muslims, but those of the Greeks as well" and he grew up at least partly speaking Greek, and earning a Hellenic education. His tutor may have been Cosmas, a Sicilian Greek kidnapped by Arabs, although the biography is sketchy, and Cosmas probably also taught John's childhood friend, St Cosmas of Maiuma,

John grew up to become a major opponent of the iconoclasts, then gaining ground in the court of Constantinople. In 726 Emperor Leo III ordered that images should not be venerated, against the wishes of the patriarch, and St John undertook a defence of holy images, gaining a reputation as a writer and influencing the Second Council of Nicaea.

John left Damascus in his 40s to become a monk, partly due to the increasingly Islamic atmosphere of Damascus, and he died in Palestine on December 4, 749, at the Mar Saba monastery outside Jerusalem.

He was declared a Doctor of the Church by Leo XIII in 1883.

# මාංශගතවීමේ අභිරහස සහ භාග්‍යවන්ත දේව මාතා වහන්සේ.

පසුගිය සතියෙන් .....

## දේව දූතයාගේ ආචාරය :-

"විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ. සමිඳාණන් වහන්සේ ඔබ සමගය." (ලූක් 1/28)
නමෝ මරියනි ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තියනි, ගබ්‍රියෙල් අග්‍රදූතයා දේව මාතා වහන්සේව ප්‍රථමයෙන්ම ආමන්ත්‍රණය කරනු ලබන්නේ එතුමියගේ මානව නාමය වන "මරියා" යන්නෙන් නොවේ. දේව දූතයාගේ ආමන්ත්‍රණය "ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තියෙනි" යන්නයි.

ශුද්ධවූ බයිබලයේ වෙන කිසිම තැනක දේව දූතයෙක් මිනිස් දියණියකට මෙසේ ආමන්ත්‍රණය කර ඇති බවක් දක්නට නැත. එම වචනය  තුළින් දෙවියන් වහන්සේම එතුමියට ගෞරවය දැක්වූ බව පැහැදිලි වේ. මරිය තුමිය පවා ඒ වදන් අසා අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක්ද"යි සිත සිතා සිටි බව සුවිශේෂක වාක්‍යය තහවුරු කරයි.

සැබවින්ම ජෝකිම්ගේ දියණියට දිව්‍යමය පණිවිඩකරුවා මෙසේ ආමන්ත්‍රණය කරනු ලබන්නේ ඇයි?

ක්‍රිස්තුන් වහන්සේ තුළින් ස්වර්ගිය ස්ථාන වල සියළු ආධ්‍යාත්මික ආශිර්වාද අපට දෙවා වදාළ, අපගේ ස්වාමීන් වන. ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ පියාණන් වූ දෙවියන් වහන්සේට ප්‍රශංසා වේවා. ප්‍රේමයෙන් උන්වහන්සේ ඉදිරියෙහි අප ශුද්ධව නොකැළැල්ව සිටින පිණිස ලෝකය මැවීමට ප්‍රථමයෙන් ක්‍රිස්තුන් වහන්සේ තුළ දෙවියන් වහන්සේ අප තෝරා ගත් සේක. (එපීස 1/3-4)

ශුද්ධවර පාවුළු තුමන් විසින් එපීසවරුන්ට ලියන ලද හසුනින් උපුටා ගත මෙම වචන ක්‍රිස්තුන් වහන්සේ තුළ මානව සංහතියට ලැබෙන විමුක්තිය පිළිබඳවූ පියාණන් වහන්සේගේ සදතනික විශ්විය සැලැස්ම ගැන අපට අනාවරණය කරයි. එම ආධ්‍යාත්මික ආශිර්වාදය දේව සමානකමට හා ස්වරූපයට මවන ලද සියලු මිනිසුන්ට අයත් වන සම්පූර්ණ හා විශ්වීය ආශිර්වාදයකි. ශුද්ධවූ ත්‍රිත්වය තුල වැඩ සිටින තුන්දෙනා වහන්සේලාගේ ආදරය තුළ එම ආධ්‍යාත්මික ආශිර්වාදය මනුෂ්‍යයා වෙත ගලා එයි. මරිය තුමිය වෙත එම ආශිර්වාදය විශේෂ හා අසමාන්‍ය ආකාරයකින් ලැබී ඇත.

"ඔබ වනිතාවන් අතර අතිශයින් ආශිර්වාද ලද්දිය" (ලූක් 1/42) යන එලිසබෙත් තුමියගේ ආචාරය තුලින්ද මේ බව අපට පැහැදිලි වේ. දේව දූතයාගේ හා එළිසබෙත් තුමියගේ මෙම ද්විත්ව ආචාරයන් තුළින් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේගේ ආධ්‍යාත්මික ආශිර්වාදය තුළ සුවිශේෂ වූ ආශිර්වාදයක් ලබා ගනිමින් ලෝකය පටන් ගැන්මට ප්‍රථම පවා මරිය මාතාව ක්‍රිස්තුන් වහන්සේගේ අභිරහස තුළ සකල පාප දෝෂයෙන් නිර්දෝෂව සිටින බව තහවුරු වේ. තවද මරිය වහන්සේ ආනා මව්තුමියගේ කුසේ පිළිසිඳ ගනු ලබන්නේ ජන්ම පාපයෙන් තොරව බව අපි විශ්වාස කරමු.

මෙම සියළු කරුණු කාරණා සාරංශගතව විමසා බැලුවහොත් අපට පෙනී යන්නේ මරිය තුමිය දෙවිපියාණන් වහන්සේ වෙතින් ඉතා සුවිශේෂ වූ ආශිර්වාදයක් ලබා ඇති බවය. සැබවින්ම මරිය තුමිය "ප්‍රිය ප්‍රසාද පූර්ණවන්තිය බවට පත්වනුයේ එතුමිය තුළ වාක්‍යයාණෝ මාංශ ගත වෙමින් දෙවියන්ගේ පුත්‍රයා දෙව් මිනිස් සුසංයෝගයකින් (දේව මානුෂයෝගය) යුක්තව එතුමියගේ කුස තුළ මිනිසත් බව ලැබ ගැනීම හා එතුමිය තුළ එකි පැවැත්ම පරිපූර්ණ විම නිසාය.

## දේව දූතයාගේ පණිවිඩය

"මරියාවනි බිය නොවන්න ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාදය ලද්දෙහිය මේ බලන්න ඔබ පිළිසිඳ ගෙන පුතෙකු ලබන්නෙහිය උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න", (ලූක් 1/30-31)

දේව දූතයා මරිය තුමිය වෙත ඉදිරිපත් කරන පණිවිඩය පැහැදිලිය. මරිය තුමිය දෙවියන් වහන්සේගේ වරප්‍රසාදය ලබා පිරිමි දරුවෙකු ප්‍රසුත කරන බවත්, ඒ දරුවාට "ජේසුස් " යන නාමය ලබා දෙන ලෙසත් දේව දූතයා ඉල්ලා සිටි.

මේ අනුව දෙවියන් වහන්සේම සිය පුත්‍රයාණන්ට දේව දූතයා මඟින් නාමයක් ලබා දෙන සේක. මෙම නාමය සම්පූර්ණයෙන්ම පුත්‍රයාණන් වහන්සේගේ අනන්‍යතාවය හා දූත සේවාව විස්තර කරයි. හෙබ්‍රෙව් බසින් "ජේසුස්" යන නාමයේ අර්ථය "දෙවියවන් වහන්සේ ගලවන සේක." යන්නයි. එනම් ලෝකයේ ගැලවුම්කරුවාණෝ මිදුම්කරුවාණෝ ගැලවීම හා මිදුම රැගෙන ලෝකයා අතරට පැමිණෙන බව මෙම නාමය ලබා දීම තුළින් වඩ වඩාත් තහවුරු කරනු ලබයි. දේව දූතයා තවදුරටත් කතා කරමින් ජේසුස් වහන්සේගේ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ මෙසේ ප්‍රකාශ කරනු ලබයි.

"උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක. පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක. උන්වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමින් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක. උන්වහන්සේ  ජාකොබ්ගේ වංශය කෙරෙහි සඳහටම රජකම් කරන සේක. උන්වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේය" (ලූක් 1/32-33)

ලබන සතියට.......

දිනේෂ් පෙරේරා - දළුගම

## පුංචි අපේ චිත්‍ර පිටුව

### අප ආදර දේව අම්මා

**නෙත්මි සුලංජලී**

07 ශ්‍රේණිය

දංකොටුව බාලිකා මහ විද්‍යාලය



### ශ්‍රී ශරීරය හා රුධිරය

**දිනුෂ මධුමාල් ප්‍රනාන්දු**

09 ශ්‍රේණිය

ශු. පවුලේ දහම් පාසල

මිල්ලව





### ලූර්දු දේව මාතාව

**ෂෙහාරා සචිනි**

08 ශ්‍රේණිය

සා. නිකුලා දහම් පාසල

මුන්නක්කරය

(මහවීදිය මීසම)



### අපි වෙමු යහපත් දරුවෝ

**රෂිනි ඉමල්ෂා**

08 ශ්‍රේණිය

ශා. අන්තෝනි දහම් පාසල

දළුපත

### ශුද්ධවූ පවුල

**තිලිනි මධුවන්ති**

08 ශ්‍රේණිය

සා. ආනා දහම් පාසල

පළඟතුරය





### ගාබ්‍රියෙල් දේවදූතයා මරියතුමීට මංගලම් කීම

**වෙත්මිණි පෙරේරා**

02 ශ්‍රේණිය

ආවේ මරියා කන්‍යාරාමය - මීගමුව

# ශු ජෝහානාදාක් මුනිවරිය





## සුදුවර චරිතයක් හඳුනාගනිමු

ශු සභා මාතාවගේ බැබළෙන තරු අතරින් බැටළු පාලිකාවක් සෙබලියක් ද වන ජෝහානාදාක් මුනිවරිය ප්‍රංශයේ නාමසාන්තුවරිය වන්නීය. උතුරු ප්‍රංශයේ උපත ලද මෙතුමිය ඇගේ පවුලේ සියල්ලන් සමග නිහඬ ජීවිතයක් ගත කළ අතර කුඩා කල සිටම දෙවිපියාට ප්‍රිය ප්‍රසන්න දියණියක වූවාය. තම පවුලේ සාමාජිකයන්ගෙන් උරුම වූ එඩේරික වෘත්තීයට පෙළඹුණු ඕ තොමෝ කුඩා කල සිටම නිර්භීතව කටයුතු කළාහ.

ඇය ජීවත් වූ අවධියේදී නිරන්තරයෙන් ප්‍රංශය හා එංගලන්තය අතර සටන් සංග්‍රාම තිබූ අතර අවස්ථා කීපයකදී පැවති යුද්ධ හේතුවෙන් එංගලන්තයට ජය අත්වී තිබුණි. මෙකල යෞවනියක ලෙස ජෝහානාදාක් තම බැටළු පට්ටිය දක්කමින් සිටි අවස්ථාවක හදිසි ආලෝකයක් තුළින් මිහිරි ගීයක් ඇයට ඇසිණි. මෙහිදී දේවදූතයන්ගේ සහ ශුද්ධවන්තයන්ගෙන් කටහඬ බව තේරුම්ගත් ඇය එම දේවහඬට අවනත වූවාය. "යන්න ඔබ ගොස් ඔබේ රට බේරාගන්න" යනුවෙන් අනාවරණයක් ඇය හට ලැබුණි. ප්‍රථමයෙන් බියට පත් වූ ඇය දෙවිදුන් කෙරේ වූ දැඩි විශ්වාසයෙන් යුතුව දෙවිදුන් තමාගෙන් බලාපොරොත්තු වන්නේ තම රට රැක ගැනීම බව සිතූ ජෝහානාදාක් තුමිය යුද ඇඳුමකින් සැරසී නිර්භීතව හමුදා සේනාංකය වෙත අසුපිටින් ගොස් නිර්භීතව යුද වැදුනාය.

මෙකල ප්‍රංශ රජුට සිංහාසනය අහිමි වී තිබුණ අතර හමුදා පිරිස්ද බියෙන් තැතිගෙන සිටියෝය. දැඩි පරිශ්‍රමයක් හා පුහුණුවක්ද දැඩි අධිෂ්ඨානශීලි බවක්ද ප්‍රංශ සේනාංකයට ලබා දුන් ජෝහානාදාක්තුමිය අභීතව යුද වැදුණාය. මෙලෙස මෙතුමියගේ දැඩි කැපවීම හා මෙහෙයවීම යටතේ ප්‍රංශ භටයෝ ජයග්‍රහණය කළෝය. මෙලෙස ප්‍රංශ රජුට නැවත ඔහුගේ මාලිගයේදීම නැවත ඔටුන්න හා සිහසුන හිමිකර දීමට ඕ තොමෝ සමත් වුහ.

ඉන්පසු ඇය රජුට මෙසේ පැවසුවාය. රජතුමනි, මගේ වැඩ කොටස අවසානයි. මට නැවත මගේ බැටළුවන් වෙතට යාමට අවසර දුන මැනවැයි කීවාය. එහෙත් රජතුමා ඇයට අවසර නුදුන් අතර රජුගේ අනුශාසක මණ්ඩලයේ සාමාජිකාවක වූවාය. එහෙත් පසුව ඇගේ මිතුරන් පිරිසක් අද ඇ හට ද්‍රෝහි වී සිය සතුරන් අතට ඇය පාවා දුන් අතර ඔවුන් විසින් දරුණු වද ගාවිනා වලට ඇයව පාත්‍ර කරන ලදී. ඇය විජ්ජාකාරියක ලෙස චෝදනා නගමින් අමු අමුවේ පුළුස්සා මරණයට පත් කරන්නට නියම කළෝය. ප්‍රංශ ජාතිකයන් අදත් ඔවුන්ගේ රට දිනා දුන් ශුද්ධවන්තිය ලෙස ජෝහානාදාක් තුමියට අදත් බැති පෙම් දක්වති. මේ නිසාම ශු සභා මාතාව සොල්දාදුවන්ගේ ආරක්ෂක මුනිවරිය ලෙස ජෝහානාදාක් මුනිවරිය සලකනු ලබන්නීය.

ඇයගේ මංගල්‍ය මැයි 30 වන දිනට යෙදී ඇත.

**අසේල දසනායක විසිනි**


අද්භූත හසිබලය ඇසුරෙන්
මෝසෙස්
71
සැකසුම, දෙබස්, චිත්‍ර
ලලිත සපුආරච්චි
පසුදා උදේ...
අර බලන්න පොළොව දෙදරනවා.
භූමි කම්පාවක්.. භූමි කම්පාවක්.. අපෝ දෙවියන් වහන්ස... අපව ගලවාගන්න..
එකම කණ්ඩායමක් ඇතුළින් ඇතිවූ විරෝධය නිසා කෝපවූ දෙවියන් වහන්සේ.. උන්වහන්සේට විරුද්ධ වූ පිරිසේ සියළු දෙනා විනාශ කිරීමට.
අම්මෝ
අනේ
අපි ඉවරයි!
භූමි කම්පාවක් සහ ගින්නක් ඇති කළේය.. එයින් දෙවියන් වහන්සේට විරුද්ධ වූ බොහෝ පිරිසක් විනාශ මුඛයට ගියේය.
නමුත්, මෝසෙස්ගේ පිරිසේ සිටි තවත් අය මැසිවිලි කියන්නට විය..
අර මැරුණු අය සමඟ අපිත් මැරුණා නම් - හොඳයි..
බොන්න වතුරක් නැද..... ඔක්කොම ඉවරවෙලා...
එවිට මෝසෙස් හා ආරොන් දෙවියන්වහන් සේට යාච්ඤා කරන්නට විය..
දෙවියන් වහන්සේගේ උපදෙස් අනුව නැවත සෙනඟ රැස්කරගත් මෝසෙස්
නුඹලාගේ කෙඳිරිලි නවතා මෙහාට වරෙල්ලා - කැරලිකරුවනි...
නුඹලා මට කියන්නේ මේ පර්වතය පලා වතුර ලබා දෙන්ට කියලද..
එසේ කිවු මෝසෙස් සිය දණ්ඩෙන් පර්වතයට පහරක් - දුන්නේය..

# ප්‍රහේලිකා අංක 47




## හරහට

1. සපීරා නම් තම භාර්යාව සමග ඉඩමක් විකුණා මුදලෙන් කොටසක් තබාගෙන ඉතිරි කොටස පමණක් ප්‍රේරිතයන් වෙතට ගෙන යාම නිසා මරණය හිමි කර ගත්තේ මොහුය.

4. ක්‍රිස්තුන් වහන්සේ උකුත් වූ අවස්ථාවේදී, අහස අඳුරු වී දේව මාළිගාවේ ............. දෙකඩව ඉරී ගිය බව ශුද්ධ ලියැවිල්ලේ සඳහන් වෙයි. මෙහි හිස්තැනට සුදුසු වචනය

5. දේව මාළිගාවේ ''සුදර්ශන'' දොරටුව අසල සිටි කොරාට කතා කළ පේදුරු තුමා ''...........වත් රිදීවත් මට නැත. මට ඇති දේ ඔබට දෙමි. නාසරෙත්හි ජේසුස් වහන්සේගේ නාමයෙන් ඇවිදින්නැ''යි කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය .

7. යක්ෂයා ක්‍රිස්තුන් වහන්සේව පරීක්ෂා කරමින්, ලෝකයේ සියළු රට රාජ්‍ය පෙන්වා යක්ෂයාට වඳින්නේ නම් ඒවායේ ......................... ඉසුරු ක්‍රිස්තුන් වහන්සේට දෙන බව කීවේය. මෙහි හිස්තැනට සුදුසු වචනය

8. ගල්ගසා මරා දැමීමට ක්‍රිස්තුන් වහන්සේ වෙතට පව්කාර ස්ත්‍රියව රැගෙන ආ විට උන්වහන්සේ''ඔබ අතරින් .........ක් නැති තැනැත්තේ පළමු ගල ගැසුවාවේ''යි ප්‍රකාශ කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

## පහළට

1. ක්‍රිස්තියානි යන නාමය ගෝලයින්ට පළමු කොට දෙනු ලැබුවේ මෙහිදී බව ශුද්ධ බයිබලයේ ක්‍රියා පොතේ සඳහන් වෙයි.

2. නරකාදිය යන වචනයට සමාන වචනයකි.

3. ගල් ගසා මරා දමන ලද, ප්‍රථම ප්‍රාණ පරිත්‍යාග වරයායි.

5. ඊශ්‍රායෙල් ජනතාව මිසරයේ වහල්කමින් මුදා ගැනීම සඳහා මෝසෙස් තුමා පාරාවෝ .......... ඉදිරියේ පෙනී සිටියේ ය. මෙහි හිස්තැනට සුදුසු වචනය

6. ක්‍රිස්තුන් වහන්සේ නොයෙකුත් ලෙඩ රෝග වලින් පීඩිතව සිටි අයව ........කළ සේක. මෙහි හිස්තැනට සුදුසු වචනය.

> මෙම ප්‍රහේලිකාව පිරවීමේ දී පහත සඳහන් බයිබල් පාඨ ද උපකාර කරගත හැකිය. ශු. ලූක් 4,23 ක්‍රියා 11,3 ශු. ජුවාම් 8

**සැකසුම :- තිළිණි දුතිකා පෙරේරා - කිරිමැටියාගාර**

**ප්‍රහේලිකා අංක 47 පිළිතුරු හා ප්‍රහේලිකා අංක 48 ලබන සතියේ**

## ඔක්තෝබර් මාසය

ඔක්තෝබර් මාසය අප දේශිය ක්‍රමයෙන් හඳුන්වන්නේ වප් මාසය ලෙසයි. ඔක්තෝබර් මාසයට මා ඉතා කැමතියි. එයට හේතුව වන්නේ ඔක්තෝබර් පළමුවනද අප සැමරූ ''ලෝක ළමා දිනය'' නිසාය. එසේම ''ලෝක වැඩිහිටි දිනය, හා ''ගුරු දිනය'' ද මෙම මාසයේදීම සැමරූ දිනයන්ය.

**ශෙනායා ප්‍රනාන්දු**
**05 ශ්‍රේණිය - ශු. පවුලේ කන්‍යාරාමය බම්බලපිටිය**

## මව්නි ඔබ සැරදේ........

කුස තුළ දරා මා දස මසක්
පොවා ලේ කිරි කර ඔබේ
හොවා මා ඔබ උකුලේ කියු නැළවිලි ගී
තාම මා දෙසවනේ රැව් දේ
යා යුතු යහමඟ කියා
නිසි මඟට මා යොමු කරමින්
ඔවදන් මිණි කිරුලෙන් මා සරසා
ඔබේ ලොවේ රැජිණිය සේ
මට කිරුළ පළන්
මගේ මව් රැජිණි ඔබයි....



**මනීෂා කෞෂල්‍යා (ආචාර්ය මඩුල්ල)**
වන්නි මඩු දහම් පාසල - අගුණවිල

**ළමා ප්‍රදීපය 06 වන සංවත්සර කලාපය ලබන සතියේ..**

# පෙර පාසල් සිඟිත්තන් එක්කළ 'දෙව්ඳු තිළිණ' ප්‍රසංගය







ළමා ප්‍රදීපය



පසුගියදා ග්‍රෑන්ඩ්පාස් සා. ජෝසප් විද්‍යාලීය ශාලාවේ දී කොළඹ අගරදගුරු පදවියේ පෙර පාසල් නඟා සිටුවීමේ අරමුණ ඇතිව අගරදගුරු පදවියේ කතෝලික අධ්‍යාපන කොමිසමේ පෙර පාසල් අනුකමිටුව සංවිධානය කරන ලද "දෙව්ඳු තිළිණ" ප්‍රසංගයේ විවිධ අවස්ථා ළමා ප්‍රදීපය කැමරා ඇසට හසුවූයේ මෙසේ ය.

සේයා - සම්පත් ඩයස්
















